සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

**06 ශ්‍රේණිය** | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** | **කාලය පැය දෙකයි**

නම / විභාග අංකය :- ...........................................................................

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) පරිගණකයට දත්ත ඇතුළත් කිරීම සඳහා යොදා ගන්නා උපක්‍රම හඳුන්වනුයේ,
1. ආදාන උපක්‍රම
2. ප්‍රතිදාන උපක්‍රම
3. ආචයන උපාංග
4. සකසන උපාංග

(02) පරිගණක මෘදුකාංග සඳහා උදාහරණයක් වනුයේ,
1. පරිගණක තිරය
2. මෙහෙයුම් පද්ධති
3. මූසිකය
4. මුද්‍රණ යන්ත්‍රය

(03) පරිගණක දෘඪාංග සඳහා උදාහරණයක් වනුයේ,
1. වෙබ් සේවාදායකයා
2. දත්ත
3. මෙහෙයුම් පද්ධති
4. පරිගණක තිරය

(04) වාර්තා සකසා ගැනීම සඳහා භාවිතා කළ හැකි යෙදුම් මෘදුකාංගයක් වනුයේ,
1. චිත්‍රණ මෘදුකාංග
2. පැතුරුම්පත්
3. වදන් සැකසුම්
4. වෙබ් අතරික්සු

(05) චිත්‍රක මෘදුකාංගයක් නොවන්නේ,
1. Smart draw
2. Adobe illustrator
3. Microsoft paint
4. Open office

(06) මෙහෙයුම් පද්ධතියේ කාර්යයක් නොවන්නේ,
1. පරිගණකය හා පරිශීලකයා සම්බන්ධ කිරීම
2. මතක කළමනාකරණය
3. ගොනු කළමනාකරණය
4. වෛරස මගින් පරිගණකය ආරක්ෂා කිරීම

(07) පරිගණකයේ ලක්ෂණයක් නොවන්නේ,
1. වේගය
2. නියත බව
3. බුද්ධිමත් බව
4. සාපේක්ෂ බව

(08) පහත දැක්වෙන උපාංග අතුරින් නිහිත පද්ධතියක් වනුයේ,
1. යතුරු පුවරුව
2. සංයුක්ත තැටි (CD)
3. රෙදි සෝදන යන්ත්‍රය
4. මයික්‍රොෆෝනය

(09) සන්නිවේදන උපාංගයක් වනුයේ,
1. දෘඪ තැටිය
2. පරිගණකය
3. ජාල අතුරු මුහුණත් කාඩ්පත
4. සුපරීක්ෂණය

(10) ''කසුන් පරිගණකය භාවිතයෙන් ලේඛනයක් සාදයි.'' මේ සඳහා කසුන්ට භාවිතා කළ හැකි මෘදුකාංගයක් විය හැක්කේ,

1. වෙබ් අතරික්සුව
2. වදන් සැකසුම් මෘදුකාංගය
3. චිත්‍රක මෘදුකාංගය
4. පැතුරුම්පත්

(11) බේරියම් ශරීරගත වීමෙන් ඇතිවිය හැකි රෝගයකි.

1. හෘද හානිය
2. ස්නායු ආබාධ
3. පෙණහැලි පිළිකා
4. මොළයේ විකෘතිතා

(12) පරිගණකය භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු නිවැරදි ඉරියව්වක් වනුයේ,

1. ඇසත් පරිගණක තිරයත් අතර දුර 100m ක ප්‍රමාණයක් තබාගත යුතුය.
2. පුටුවෙහි වාඩිවන විටදී පිටුපසට නැමී වාඩිවිය යුතුය.
3. යතුරු පුවරුව හා මූසිකය වැලමිට කෙලින් තබාගත යුතුය.
4. පාද පොළවට ලම්භකව තබා නොගත යුතුය.

(13) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිවැරදි ක්‍රමය වනුයේ,

1. වෛරස
2. 3R
3. මුරපද
4. ඉලෙක්ට්‍රොනික් ලිපි

(14) ප්‍රතිදාන උපාංගයක් වනුයේ,

1. තීරුකේත කියවනය
2. මූසිකය
3. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
4. මොඩමය

(15) පරිගණකයෙහි මොළය ලෙස සලකනුයේ,

1. මව් පුවරුව
2. මධ්‍ය සැකසුම් ඒකකය
3. පරිගණක තිරය
4. ප්‍රාථමික මතකය

(16) වෙළඳසැලක් තුළදී බොහෝවිට දැකිය හැකි උපාංගයක් වනුයේ,

1. සුපරීක්ෂණය
2. තීරුකේත කියවනය
3. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
4. වෙබ් කැමරාව

(17) රොබෝ තාක්ෂණය යොදාගනු ලබන ක්ෂේත්‍රයක් වනුයේ,

1. ප්‍රවාහනය
2. අධ්‍යාපනය
3. කර්මාන්තශාලා
4. කෘෂිකර්මාන්තය

(18) පරිගණකයේ පියා ලෙස හඳුන්වනුයේ,

1. ඇඩා ලම්ලේස්
2. මාර්කෝනි
3. චාල්ස් බැබේජ්
4. ඇලෙක්සැන්ඩර්

(19) ආදාන උපක්‍රමයක් වනුයේ,

1. මුද්‍රණ යන්ත්‍රය
2. යතුරු පුවරුව
3. ස්පීකර්
4. පරිගණක තිරය

(20) ආචයන උපාංගයක් වනුයේ,

1. පරිගණක තිරය
2. සංයුක්ත තැටි (CD)
3. මූසිකය
4. යතුරු පුවරුව

## II - කොටස

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) Input → A → B

1. A, B හඳුන්වා එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.
2. B සඳහා යොදා ගනු ලබන උපක්‍රමයන් 3ක් ලියන්න.
3. පරිගණකයේ කාර්යයන් 2ක් නම් කරන්න.
4. සැකසීම සඳහා පරිගණකයට ආදානය කරනුයේ මොනවාද?

(02) 1. පරිගණකය යනු කුමක්ද?
2. පරිගණකයේ ලාක්ෂණික ගුණාංග 3ක් නම් කරන්න
3. නිහිත පද්ධති භාවිතා කරන උපාංග 3ක් නම් කරන්න.
4. දත්ත සන්නිවේදන උපාංග 3ක් නම් කරන්න.

(03) 1. මෘදුකාංග යන්න හඳුන්වන්න.
2. එදිනෙදා ජීවිතයේදී භාවිතයට ගැනෙන මෘදුකාංග 3ක් නම් කරන්න.
3. ප්‍රධාන මතකය හඳුන්වන වෙනත් නාමයක් ලියා දක්වන්න.
4. දෘඩාංග හා මෘදුකාංග අතර පවත්නා වෙනස්කම් 2ක් සඳහන් කරන්න

(04) 1. පරිගණකය භාවිතා කරන ක්ෂේත්‍ර 3ක් නම් කරන්න.
2. පාසල තුළදී පරිගණකය භාවිතා වන අවස්ථා 3ක් ලියන්න.
3. බැංකු කටයුතු සඳහා පරිගණකය භාවිතා වන අවස්ථා 3ක් නම් කරන්න.
4. රෝහල් තුළ නිහිත පද්ධති භාවිතා වන අවස්ථා 2ක් සඳහන් කරන්න.

(05) ''පරිගණක විද්‍යාගාරය නිවැරදිව සහ ආරක්ෂිතව පරිහරණය කරමු.''
1. පරිගණක ආචාර ධර්ම යනු කුමක්ද?
2. පරිගණක ආචාර ධර්ම 2ක් සඳහන් කරන්න.
3. පරිගණක විද්‍යාගාරය තුළදී ඔබගේ ආරක්ෂාව සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග 2ක් ලියා දක්වන්න.
4. පරිගණක විද්‍යාගාරය තුළ පවතින උපාංගවල ආරක්ෂාව සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග 2ක් නම් කරන්න.

(06) 1. පරිගණකය භාවිතයේදී අනුගමනය කළයුතු නිවැරදි ඉරියව් 3ක් නම් කරන්න.
2. ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය යනු කුමක් ද?
3. "3R ක්‍රමය'' හඳුන්වන්න.
4. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ශරීරගත වීම නිසා ඇතිවිය හැකි රෝග 3ක් සඳහන් කරන්න